ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2018

| 09 ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව I - II | කාලය පැය 02 |
|---|---|---|

❖ උපදෙස් :

- I හා II යන කොටස්වලින් මෙම පත්‍රය සමන්විතය.
- I කොටසේ සියලුම ප්‍රශ්නවලට හා 11 කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.
- 1 හා 11 ප්‍රශ්න පත්‍ර සඳහා මුළු ලකුණු 50ක් වන අතර, ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50ක් වශයෙන් මුළු ලකුණු 100 කි.

---

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර පහත වරහන් තුළින් තෝරන්න.

1. ආත්මගත හා අපවාරිත භාෂණ ............................. සංවාද වලට අයත් වේ.

2. නාට්‍ය සන්දර්භයේදී චරිතයක දැකිය හැකි විවිධ පැතිකඩ ............................. නමින් හඳුන්වයි.

3. චරිත අතර ප්‍රතිවිරෝධී අදහස් මතුවීම නිසා ............................. හටගනී.

4. පරිකල්පනයෙන් මවා ගන්නා චරිතය, ක්‍රියාකරන ආකාරය,තම සිරුර උපයෝගී කරගෙන පෙන්වීම .......................... නම් වේ.

5. නළුවාට මුහුණේ උපාංග වලනය කරමින් සාත්වික අභිනය නිරූපණය කිරීමට ............................. අභ්‍යාස උපකාරී වේ.

(භූමිකා / චරිත නිරූපණ / දර්පන තල / නාට්‍යධර්මී / සමාරෝපය / ලෝකධර්මී)

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා හිස්තැනට ගැළපෙන පිළිතුර ලියන්න.

6. නාට්‍යකලාවේදී ප්‍රධාන ප්‍රකාශන මෙවලම් ලෙස ............................. භාවිත කරයි.

7. පදනම් ආලේපය ............................. සඳහා භාවිත කරයි.

8. වේදිකා නාට්‍ය සඳහා සංකේතාත්මකව මිනිස් සිරුර උපයෝගී කොට ගෙන ............................. නිර්මාණය සිදු කරයි.

9. නළුවෙකු හට චරිතයක් සාර්ථකව නිරූපණය කිරීමට ............................. හා ............................. සමාරෝපය ඉතා වැදගත් වේ.

10. ............................. අභ්‍යාස ප්‍රගුණ කිරීමෙන් නාට්‍යවල සංවාද භාවිතයට අවශ්‍ය පරිචය ලබා ගනී.

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| රචකයා | නාට්‍යයේ නම | නිර්මාණය කළ ශෛලිය | ආශ්‍රය කරගත් ජාතකය / ගැමි නාටකය |
|---|---|---|---|
| ගුණසේන ගලප්පත්ති | සඳ කිඳුරු | **ක** | චන්ද කින්නර ජාතකය |
| දයානන්ද ගුණවර්ධන | **ග** | ගැමි රංග ශෛලිය | **ජ** |
| **ට** | ලෝම හංස | නාට්‍ය ධර්මී | **ඞ** |

11. "**ක**" අක්ෂරයෙන් දැක්වෙන්නේ,

I. ලෝකධර්මී ශෛලියයි. II. කවි නාඩගම් ශෛලියයි.

III. නාට්‍යධර්මී ශෛලියයි. IV. සිංදු නාඩගම් ශෛලියයි.

12. "**ග**" අක්ෂරයෙන් ප්‍රකාශිත නාට්‍ය වන්නේ,

I. මා හේනේ රීරි යකා ය. II. ලියතඹරා ය.

III. ජස ලෙංචිනා ය. IV. නරිබෑණා ය.

13. "**ජ**" අක්ෂරයෙන් දැක්වෙන දැක්වෙන ජාතකය /ගැමි නාටකය වන්නේ,

I. කෝලම් ය. II. නාඩගම් ය .

III. මහාසාර ය. IV. වෙස්සන්තර ය.

14."**ට**" අක්ෂරයෙන් දැක්වෙන නාට්‍යකරු වන්නේ,

I. කේ.බී. හේරත්‍ය. II. දයානන්ද ගුණවර්ධන ය.

III. ගුණසේන ගලප්පත්ති ය. IV. එදිරිවීර සරච්චන්ද්‍ර ය.

15."**ඞ**" අක්ෂරයෙන් දැක්වෙන ජාතකය / ගැමි නාටකය වන්නේ,

I. බව කඩතුරාව ය. II. මහාපදුම ය.

III. සොකරි ය. IV. කෝලම් ය.

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට ගැළපෙන නිවැරදි පිළිතුර තෝරන්න.

16. රංගභූමි අලංකරණය හා වෙස්ගැන්වීම් පිළිබඳව ද දක්ෂතා පෙන්වමින් නරිබෑණා නාට්‍යයේ නරියාගේ චරිතය රඟ දැක්වූ ශිල්පියෙකි.

I. සිරිල් වික්‍රමගේ II. නිශ්ශංක දිද්දෙණිය

III. සාලමන් ෆොන්සේකා IV. මාක් ඇන්ටනී ප්‍රනාන්දු

17. ප්‍රවීණ ළමානාට්‍ය අධ්‍යක්ෂකවරියක් සහ ටෙලිනාට්‍ය, වේදිකා සහ සිනමා රූපණ ශිල්පිනියකි.

I. ට්‍රිලීෂියා ගුණවර්ධන II. සෝමලතා සුබසිංහ

III. මාලනී රණසිංහ IV. රුක්මණී දේවී

18. රංජිත් ධර්මකීර්ති විසින් අසම්මත රංග ශෛලියෙන් නිර්මාණය කළ නාට්‍ය වන්නේ,

I. හස්තිරාජ මහත්තයා　　II. අංගාරා ගඟ ගලා බසී

III. ආඬිරැලේ නාඩගම　　IV. වෙරි උයන

19. සිංහල නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ දයානන්ද ගුණවර්ධනයන් කළ වාර්තා රංගයට අයත් සුවිශේෂී නාට්‍ය දෙකකි.

I. ස්වර්ණතිලකා,පරාස්ස　　II. නරිබෑණා,පරාස්ස

III. කාමරේ පොරේ,නරිබෑණා　　IV. මධුර ජවනිකා ,ආනන්ද ජවනිකා

20. ලංකාවේ ප්‍රථමවරට කැරකෙන වේදිකාවක රඟ දැක්වූ වේදිකා නාට්‍ය වන්නේ,

I. මූදු පුත්තු　　II. බක්මහ අකුණු

III. මනමේ　　IV. මෝදර මෝල

(ලකුණු 1×20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01. I. කදා වළලු නාට්‍යයට පදනම් කරගත් ජාතක කථාව නම් කරන්න.

II. මෙම නාට්‍යය අයත් වන ශෛලිය කුමක්ද?

III. කදා වළලු නාට්‍යයේ රචකයා නම් කරන්න.

IV. දුෂ්ට ගති ඇති වෙළෙන්දා නම් කර, ඔහුගේ දුෂ්ටභාවය මතුකරන අවස්ථාවක් දක්වන්න.

V. මෙම නාට්‍යයෙහි දැක්වෙන චිත්ත අභ්‍යන්තර ගැටුම් අවස්ථාවන් 2ක් පෙන්වා දෙන්න.

(ලකුණු 2×5 = 10)

02. I. නාට්‍ය පෙළක් යනු කුමක්ද? (ලකුණු 2)

II. නාට්‍ය පෙළක් මඟින් හෙළිවන රචකයාගේ ගුණාංග 3ක් දක්වන්න. (ලකුණු 3)

III. නාට්‍ය පෙළක ඇතුළත් වන අංග පිළිබඳව නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 5)

03. I. නාට්‍යයක් නිර්මාණය කිරීමේදී භාවිතා කරන ආනුෂංගික කලාවන් 3ක් නම් කර කෙටියෙන් හඳුන්වන්න.(ලකුණු 2)

II ආනුෂංගික අංග සැලසුම් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 3ක් දක්වන්න. (ලකුණු 3)

III. ඔබ විසින් නැරඹූ නාට්‍යයක ආනුෂංගික අංග භාවිත කර ඇති ආකාරය පිළිබඳව නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 5)

04 . I. බෞද්ධ පූජාකර්ම 3ක් නම් කරන්න. (ලකුණු 2)

II. බෞද්ධ පූජාකර්ම බිහිවීමට හේතු වූ ඓතිහාසික පසුබිම කුමක්ද? (ලකුණු 3)

III. ඔබ ඉහත දැක්වූ එක් බෞද්ධ පූජාකර්මයක දැකිය හැකි නාට්‍යමය ලක්ෂණ පිළිබඳව සාකච්ඡා කරන්න(ලකුණු 5)

| |
|---|
| ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය |
| දෙවන වාර පරීක්ෂණය - 2018 |
| 09 ශ්‍රේණිය    නාට්‍ය හා රංග කලාව - **ප්‍රායෝගික පරීක්ෂණය**    කාලය විනාඩි 30 |

## එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 50 කි.

01. කථන පරීක්ෂණය -

නිර්දිෂ්ට පෙළ ආශ්‍රිතව සංවාද කොටස් ශිෂ්‍යයා අතට ලබා දී, ඉදිරිපත් කිරීමට සලස්වන්න.

**ගුරු භවතුන්ට උපදෙස් :**

(නිර්දිෂ්ට පෙළ ආශ්‍රිත සංවාද 4ක් අන්තර්ගත කොටස් 10ක් වෙන් කර තබා ගත ගන්න. එය අංක කරන්න. ශිෂ්‍යයා අහඹු ලෙස තෝරා ගත් අංකයට අදාළ නිර්දිෂ්ට කොටස ලබාදී සූදානම් වීමට විනාඩි 5ක කාලයක් ලබා දී, ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.)

01. පහත නිර්ණායක ඇසුරින් ලකුණු ලබා දෙන්න.

I. සංවාදය ඉදිරිපත් කිරීමට සූදානම් වන ආකාරය
II. අර්ථය උද්දීපනය වනසේ දෙබස් උච්චාරණය
III. අභිනය භාවිතය
IV. සමස්ත සාර්ථකත්වය
V. ගුරුභවතා විසින් සංවාද ඛණ්ඩය ඇසුරෙන් අසන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම.
( උදා - රචකයා කව්ද?)

02. ඕනෑම නාට්‍ය ගීතයක් රංගනය මඟින් ඉදිරිපත් කිරීමට සැලසීම.

I. නාට්‍ය ගීතය නිවැරදිව ගායනා කිරීම.
II. ගීතය තුළ භූමිකාව හඳුනා ගැනීම.
III. නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම.
IV. අවකාශ භාවිතය.
V. සමස්ථ සාර්ථකත්වය.

03. ක්ෂණික නිරූපණයක් කිරීමට අවස්ථාව ලබා දීම.

**ගුරු භවතුන්ට උපදෙස් :**

(විෂය නිර්දේශයට අදාළව චරිතයන් 5ක් නම් කර, ශිෂ්‍යයා තෝරාගත් අංකයට අදාළව චරිතය නිරූපණය කිරීමට සූදානම් වීමට විනාඩි 5ක කාලයක් ලබා දී චරිතය ඉදිරිපත් කිරීමට සැලසීම.)

I. චරිතයට අදාළ ලෙෂ අභිනය භාවිතා කිරීම.
II. චරිතය තුළ විවිධ භූමිකා හඳුනාගෙන තිබීම.
III. නාට්‍යෝචිත ලෙස සිද්ධි ගලපා ගැනීම.
IV. උචිත රංග ශිල්ප ක්‍රම භාවිතය.
V. ඍංගභූමිය භාවිතා කිරීම.

04. ක්ෂණික සාමූහික රංගනය

**ගුරු භවතුන්ට උපදෙස් :**

(සිසුන් 6 දෙනෙකු බැගින් කණ්ඩායම් කර, විෂය නිර්දේශයට අදාළව මාතෘකාවක් ලබා දී සූදානම් වීමට අවස්ථාව ලබා දී ක්ෂණික රංගනයක් ඉදිරිපත් කිරීමට සලස්වන්න.)

I. මාතෘකාවට අදාළ බව.
II. නාට්‍යෝචිත අවස්ථා ගොඩ නැගීම.
III. අභිනය භාවිතය.
IV. සංවිධානාත්මක බව.
V. සාමූහික බව විද්‍යාමාන වීම.

05. කතා පුවතක් නාට්‍යයානුසාරීව ඉදිරිපත් කිරීම (කේවල) කාලය විනාඩි 3 - 5 ත් අතර විය යුතුයි.

සාම්ප්‍රදායික හෝ දෙස් විදෙස් ජනකතා/සුරංගනා කතා/උපමා කතා හෝ වෙනත් සුදුසු කතාවකි.

(නාට්‍යෝපකරණ,නිරූපණ,පසුතල,සංගීත ශබ්ද සමායෝජනය භාවිතා කළ හැක,)

I. නිර්මාණශීලී ඉදිරිපත් කිරීම.
II. භූමිකාව හඳුනා ගැනීම.
III. නාට්‍යෝචිත බව.
IV. අභිනය භාවිතය.
V. සමස්ථ සාර්ථකත්වය.